

# හෙළ දරුවන්ගේ දස්කම් ඔප්නැංවූ
# හෙළ දරු වරුණ ප්‍රසංගය

*Photographs* -**Nimal Navaratne**











**වි**දේශ රටවල ඉපිද හැදෙන වැඩෙන ශ්‍රීලාංකික දරුවන්ට සිය මව්බස හා මව්බිමේ සංස්කෘතික හැදියාවන් ප්‍රගුණ කරවීමේ උතුම් කාර්‍යයක් ලෙස පසු ගිය ඔක්තෝබර් මස 17 වෙනි දින බටහිර ලන්ඩනයේ හවුන්ස්ලෝහි ලැම්ප්ටන් පාසැල් ශාලාවේ දී කරළියට ගෙන ආ **හෙළ දරු වරුණ** නම් ආශ්වාදජනක ප්‍රසංගය නැරඹූ මම පසක් කළෙමි. එහි අගය වඩාත් තීව්‍ර වන්නේ ඒ ප්‍රසංගයේ ආරම්භයේ සිට අවසාන මොහොත දක්වා බිඳකුදු විඩාව කින් තොරව ප්‍රීතිමත් සිතින් එය නරඹන්නට හැකිවීමත්, එකද ඉංග්‍රීසි වදනක් මිශ්‍ර නොකොට චතුර ලෙස සිංහල බස හසුරුවමින් ඒ දරුදැරියන් විසින්ම කථනය කරනු ලබමින් නර්තන ගැයුම්, වන්නම්, කස්තිරම් ඈ සියල්ල මනාසේ වේදිකාවට ගෙන ඒමයි.

විදේශගතවූ පමණින් තම මව්බිමට ආවේණික සියළු ගති පැවතුම් මුළුමනින් හැරදමා, බටහිර ක්‍රමවේද වැළඳගෙන, අද නමට පමණක් සිංහල වී සිටින 'සිංහල' දෙමව්පියන්ද, 'සිංහල' දරුවන්ද, මේ එක්සත් රාජධානියේ සිංහල ජන-කොට්ඨාශය අතර අපට අනන්තවත් මුණගැසේ. එහෙත් ඒ අතර අතළොස්සක් වුවද දෙමව්පියන් බටහිර සිටියද, එයට ගැත්තන් නොවී, සිය සිංහලකම සහ සිංහල හැදියාව අනුව ජීවත්වෙමින්, මෙහි උපන් සිය දරුවන් ද ඒ මගෙහිම ගෙනයනු දැක්ම ඇත්තෙන් ම ප්‍රශංසනීය ය. ගරු නම්බු ලැබිය යුත්තෝ, පිදුම් ලැබිය යුත්තෝ ඒ දෙමව්පියෝ වෙති.

මේ හේතුව තුළ ඇත්තේ අන් කිසිවක් නොව ඔවුන් මනසින් හදවතින් සැබෑ සිංහලයින් වීමයි. තම දරුවන් මෙවැනි කාර්‍යයකට යොමුකරවන්නට සිත් දෙන්නේ ද ඒ සිංහලකම කොයි දීපංකරේ ගියද ඔවුන් සිත්හි නොනැසී නොනිමී දැල්වෙන බැවිනි.



භාෂාව හා සංස්කෘතිය යනු ඕනෑම ජාතියක් වඳ නොවී නොනැසී ලොව පවතින්නට උපකාරී වන අංගයන් දෙකකි. එය ජාතියක ජීවනාලිය හා පිට කොන්ද ද වේ. ඒ ද්විගුණයෙන් කිසියම් ජාතියක් තොරවේනද ඒ ජාතිය මිහිපිට සිටිය ද කිසිදු වටිනාකමක් නැති මැටිගුලියක් හා සමාන වන්නේ ය. මැටි පිඩක කුමන බැබලීමක් ද?

**හෙළදරු වරුණ** මාහැඟි ප්‍රසංගය ලන්ඩන් කරළියට ගෙන ඒමට මුලිකවූ ආසිරි බණ්ඩාර මහතා ප්‍රමුඛ ඒ විශිෂ්ඨ දේශප්‍රේමී සංවිධායක මණ්ඩලයට ද ප්‍රසංගය ආලෝකමත් කළ ඒ සුන්දර දරුදැරියනට ද අප කාගේත් ප්‍රණාමය නිසැකවම හිමිවිය යුතු බව කියමි.

♦ *දයා ආනන්ද*

## ලන්ඩන් විහාරයේ දානමය පිංකමක්

**ලන්ඩන් විහාරාධිපති පූජ්‍ය බෝගොඩ සීලවිමල නාහිමියන්ගේ මෑණියන් වන ඒ එම් කුමාරිහාමි මහත්මිය කළුරියකර තුන් මාසයක් පිරීම නිමිත් තෙන් මහා දානමය පිංකමක් මෙම නොවැම් බර් 29 වන ඉරිදා ලන්ඩන් බෞද්ධ විහාරයේදී පැවැත්වේ. එයට සහභාගි වන ලෙස සැදැහැවතුන්ට කෙරෙන ආරාධනයයි.**

## පුලන්නා යනු කවරෙක්ද?

### සයිප්‍රස් හි පාඨකයින්ට පිළිතුරු

✻ පුලන්නා යනු දුප්පතෙකු වුවද කිසිවක් නොඉල්ලන්නෙකි. එහෙත් බලාපොරොත්තු වන්නෙකි. යාචකයා හෝ හිඟන්නා පිනට යමක් ඉල්ලා සිටී. පුලන්නා එසේ ඉල්ලා කන්නලව් කරන්නේවත් කිසිවෙකුට අතපාන්නේවත් නැත. එහෙත් දුන්නොත් යමක් ගනී. ඉස්සරහට දුවගොස් ඉල්ලන්නෙකු නොවේ. ඔහු පැත්තකට වී ඒ දෙස බලා සිටී. පුලන්නා යන වචනය සෑදුණේ පුල පුලා ඉඳීම හෙවත් ආශාවෙන් බලා පොරොත්තුව ඉඳීම යන අර්ථයෙහි නාම පදය වශයෙනි. ලැබේයයි පුල පුලා සිටින්නා පුලන්නාය.

✻ අන්තිම සිංහල රජ - ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමාය. ( 1707-1739 )

✻ අළු කෙසෙල් කෑමෙන් පිරිමින් බෙලහීනත්වයට පත්වෙනවා යයි කීමේ කිසිදු සත්‍යතාවක් නැත.





www.HOLIDAYAIR.com 0208 440 0770
The No. 1 Agent to Sri Lanka
Do not book your Air Ticket with any other travel agent until you speak to us!

HolidayAir A Travel Experience to Remember
2010 Special Deal
COLOMBO £200 +Taxes
1st Jan -30th Jun 2010
KUWAIT AIRWAYS

Selected Date Offer
SriLankan £320 +Taxes
Sep / Oct / Nov 2009

Best Value Deals - Colombo
SriLankan £350* + Taxes including free stopover
India / Hong Kong / Tokyo / Beijing / Singapore / Bangkok / Kuala Lumpur
11 Aug. - 09 Dec. 2009
KUWAIT AIRWAYS £200 +Taxes
04 Aug. - 09 Dec. 2009
QATAR AIRWAYS £300 +Taxes
16 Aug. - 26 Mar. 2010

IATA
Unbeatable worldwide fares now available on our 24-hour online booking system
96 High Street, Barnet, Herts EN5 5SN
Open 6 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm Closed- Sunday & Bank Holidays
MCG